23

# පරාක්‍රමබාහු රාජ මාළිගය හා එහි උපයෝගිතාවය

*බී. ඒ. චතුරි ගුණරත්න* [1]
*කේ. පී. ඞී. ඒ. එන්. ජයසිංහ* [2]
HS/2013/0250, HS/2013/1210

වෛජයන්ත ප්‍රාසාදය යන නම්වලින් හඳුන්වන මෙම රාජකීය මාළිගය මහාපරාක්‍රමබාහු රජතුමාගේ මාළිගාවයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ පරාක්‍රමබාහු රාජමාළිගයහා එහි උපයෝගීතාවය පිළිබඳ සාකච්ඡා කිරීමටයි. මෙම මාළිගය පොළොන්නරුවේ තිබෙන විශාලතම ගොඩනැගිලි සංකීර්ණය යි. අද වන විට මෙහි නටබුන් පමණක් ශේෂ ව තිබේ. පොළොන්නරුව ආක්‍රමණය කළ කාලිංග මාඝගේ දරුණු විනාශකාරී ප්‍රතිපත්ති හේතුවෙන් මාළිගාව පවා ගිනිබත් කර විනාශකර තිබේ. මාළිගාව මහල් 07කින් යුතු බව සඳහන් ය. බිසෝ මාළිගය සීත කුටිය පුස්තකාල ගෘහය අභ්‍යන්තර විනෝද කටයතු සඳහා උපයෝගි කර ගත් ගොඩනැගිලිවලින් යුක්තයි. ගඩොල්, හුණු බදාම භාවිතාකර තිබේ. අවශේෂ අංග ඇතුළුව කාමර 1000 ක් පමණ තිබූ බව සඳහන් වේ. ගඩොල් හා දැව ද භාවිත කර තිබේ. ප්‍රධාන ඇතුළුවීමේ දොරටුවෙන් විශාල අංගනයට පිවිසේ. එහි දිග අඩි 102 x 42 වේ. ඉදිරිපස ඉතිරි වී තිබෙන සුවිශාල බිත්තිය තුළ ඇති හිඩැස් මගින් පැහැදිලි වනුයේ විශාල දැවකණු ඒ තුළින් රිංගවා ඒ මත ලී අතුරා මහල් නිර්මාණය වූ බවයි. ගොඩනැගිල්ල අභ්‍යන්තරය හුණු බදාම යොදා අලංකාර කළ බව ශේෂව ඇති නටඹුන් මගින් පැහැදිලි වේ. දැනට මෙහි මහල් තුනක පමණ නටඹුන් තිබේ. මහල්වලට නැගීමට දැවයෙන් කළ පියගැටපෙළක් තිබූ බව සඳහන්වේ.

ප්‍රමුඛ පදඃ වෛජයන්ත ප්‍රාසාදය, පොළොන්නරු යුගය, ගෘහ නිර්මාණ

---

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) පළමු වසර*

*2 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) පළමු වසර*